**ඉතුරුම් ගිණුම්**

- පුද්ගල
  - සාමාන්‍ය ඉතුරුම් ගිණුම්
  - දිරිලිය කාන්තා ඉතුරුම් ගිණුම්
  - Next Gen ඉතුරුම් ගිණුම්
  - ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් ගිණුම් (වයස අවුරුදු 60ට වැඩි)
  - මුතු ළමා ඉතුරුම් ගිණුම් (වයස අවුරුදු 18ට අඩු)

- ආයතනික

ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන සහ වලංගු හැඳුනුම්පතක් (ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රයක්) ඇති, වයස අවුරුදු 18ට වැඩි ඕනෑම අයෙකුට සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් විවෘත කළ හැකිය.

ශ්‍රී ලංකාව තුල ලියාපදිංචිය සිදු කර ඇති හා වලංගු නෛතික ලියකියවිලි (ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකය/සංස්ථාගත කිරීමේ සහතිකය) සහිත ඕනෑම ආයතනයක්, සමාගමක්, භාර අරමුදල් හෝ පුණ්‍යායතනයකට ආයතනික ඉතුරුම් ගිණුමක් විවෘත කළ හැකිය.

- ගිණුමක් විවෘත කිරීම සඳහා අවම මුදල රුපියල් 300 කි.

- මුදල්, බැංකු තැන්පතු හෝ චෙක්පත් මගින් තැන්පතු පිළිගනු ලබන අතර, චෙක්පත් සිංගර් ෆිනැන්ස් (ලංකා) පි.එල්.සී නමින් "ගිණුම් හිමියාගේ ගිණුමට පමණයි" ලෙස රේඛනය කර ලබා දිය හැකිය.

- ඉතිරිකිරීමේ පාස්පොත හෝ ඉතිරිකිරීමේ ප්‍රකාශය අතරින් එක් විකල්පයක් පාරිභෝගිකයා හට තෝරා ගත හැක. ඉතිරිකිරීමේ පාස්පොත අස්ථාන ගත වූවහොත් ඒ පිළිබඳව වහාම සමාගම දැනුවත් කලයුතු අතර නව පාස්පොතක් නිකුත් කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් සමාගමට ලබා දිය යුතුය.

- පොලිය දිනපතා එකතු වන අතර මාසිකව ගිණුමට බැර කෙරේ.

- සියලුම ඉතුරුම් ගිණුම් හිමියන් සඳහා හරපතක් (Debit Card) පිරිනමනු ලබන අතර එය ඕනෑම වීසා පිළිගත් ATM යන්ත්‍රයකින් සහ බලයලත් වෙළෙන්දන්ගේ POS යන්ත්‍රයකින් භාවිතා කළ හැක.

- සියලුම ඉතුරුම් ගිණුම් හිමියන් සඳහා අන්තර්ජාල බැංකු පහසුකම ඇත.

- ගිණුමේ අවම ශේෂය රුපියල් 300ක් විය යුතුය.

- දින 365ක් දක්වා ගනුදෙනු නොමැති ඉතිරිකිරීමේ ගිණුම් අක්‍රිය වන අතර, නැවත සක්‍රිය කිරීම පාරිභෝගිකයාගේ ඉල්ලීම මත සිදු කරනු ලැබේ. අක්‍රිය තත්ත්වයේ වසර 10ක් දක්වා දිගටම පවතී නම්, එවැනි ගිණුම් 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ මහ බැංකුවට වාර්තා කරනු ලැබේ.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් එක් තැන්පත්කරුවෙකු සඳහා උපරිම වශයෙන් රුපියල් 1,100,000ක් දක්වා වන්දි ගෙවීම සඳහා, ඉතුරුම් ගිණුම් රක්ෂණය කර ඇත.

- ගිණුම වසා දැමීමකදී, සමාගම විසින් රුපියල් 300ක සේවා ගාස්තුවක් අඩු කරනු ලැබේ.

- අනවසර හෝ වැරදි ගනුදෙනුවක් සිදුවුවහොත්, සහාය සඳහා වහාම සමාගමට දැනුම් දිය යුතුය.

ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීම සඳහා පහත ලිපි ලේඛන නිසි පරිදි පුරවා ළඟම ඇති ශාඛාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. අවශ්‍ය නම් ඔබට මෙහි ලේඛන පහත සබැඳියෙන් බාගත කළ හැක.

https://www.singerfinance.com/downloads/

**තනි පුද්ගල/ හවුල්**

- ඉතුරුම් අයදුම් පත්‍රය
- ගනුදෙනුකරු පිලිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- FATCA පෝරමය
- ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්
- ලිපිනය තහවුරු කිරීම සඳහා ලේඛන (අවශ්‍ය නම්)
- අන්තර්ජාල බැංකු පහසුකම සඳහා අයදුම්පත
- හරපත් (Debit Card) අයදුම්පත
- නාමිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ලේඛන (අවශ්‍ය නම්)

**ආයතන සඳහා**

- ඉතුරුම් අයදුම් පත්‍රය
- ආයතනය පිලිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- FATCA පෝරමය
- ව්‍යාපාර ලියාපදිංචිය/සංස්ථාගත කිරීමේ සහතිකය
- සමාගම් ව්‍යවස්ථාව
- අධ්‍යක්ෂක මණ්ඩලයේ යෝජනාව
- ප්‍රතිලාභී හිමිකාරිත්වයේ ප්‍රකාශය
- අධ්‍යක්ෂකවරුන් පිලිබඳ දැන ගැනීමේ පෝරමය (KYC)
- අධ්‍යක්ෂකවරුන්ගේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක්
- බලයලත් අත්සන්කරුවන් තහවුරු කිරීමේ ලිපිය
- බලයලත් අත්සන්කරුවන්ගේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/ රියදුරු බලපත්‍රයේ පිටපතක්
- පෝරමය 20
- පෝරමය 13 (සමාගමේ ලිපිනය වෙනස්වී ඇත්නම්)

අප සමාගම ආකර්ශනීය පොලී අනුපාත ඉතුරුම් ගිණුම් සඳහා පිරිනමනු ලැබේ. පාරිභෝගිකයාට දැනුම් දීමකින් තොරව ගාස්තු සංශෝධනය කිරීමට සමාගමට අයිතිය ඇත.

පොලී අනුපාත පත්‍රය පහත සබැඳියෙන් බාගත කළ හැක.
https://www.singerfinance.com/savings-accounts/

මෙහි පැමිණිලි හෝ යෝජනා ඉදිරිපත් කළ හැක.

අවශ්‍ය නම් පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය පහත සබැඳියෙන් බාගත කළ හැක.
https://www.singerfinance.com/wp-content/uploads/2024/08/Complaint-Handling-Policy-Sinhala-Version.pdf

**මුතු ළමා ඉතුරුම් ගිණුම්**

මුතු ළමා ඉතුරුම් ගිණුම බාල වයස්කරුවෙකුගේ (වයස අවුරුදු 18 ට අඩු) නමින් දෙමාපියන්/භාරකරු විසින් විවෘත කළ හැක.

- බාල වයස්කරුගේ උප්පැන්න සහතිකය, දෙමාපියන්ගේ/භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක් සහ පදිංචිය තහවුරු කිරීමේ ලේඛන (අවශ්‍ය නම්) ඉදිරිපත් කළ යුතුය.
- ගිණුමක් විවෘත කිරීම සඳහා අවම මුදල රුපියල් 300 කි.
- මුදල්, බැංකු තැම්පතු හෝ චෙක්පත් මගින් තැන්පතු පිළිගනු ලබන අතර, චෙක්පත් සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී නමින් "ගිණුම් හිමියාගේ ගිණුමට පමණයි" ලෙස රේඛනය කර ලබා දිය හැකිය.
- බාල වයස්කරුගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ විට, ගිණුම ස්වයංක්‍රීයව සාමාන්‍ය ඉතුරුම් ගිණුමකට මාරු වේ. කෙසේ වෙතත්, බාල වයස්කරු ශාඛාවකට පැමිණීමෙන් සහ ඔහු/ඇය ගිණුම් හිමියා බව ඔප්පු කිරීමෙන් හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම් මිස, බාල වයස්කරුට ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට නොහැකි වනු ඇත. මීට අමතරව, අවශ්‍ය ලියකියවිලි සම්පූර්ණ කිරීමෙන් අලුත් සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් පවත්වාගෙන යාමට ගිණුම් හිමියාට අවස්ථාව තිබේ. සාමාන්‍ය ඉතුරුම් ගිණුම් යටතේ වර්ග කර ඇති සියලුම ගිණුම් සඳහා සමාගමේ සාමාන්‍ය ක්‍රියා ප්‍රතිපත්තිය අදාළ වේ.
- බාල වයස්කරුට වයස අවුරුදු 18 සම්පූර්ණ වනතුරු මුදල් ආපසු ගැනීමට අවසර නොදේ.
- සියලුම මුතු ඉතුරුම් ගිණුම් සඳහා පාස්පොතක් නිකුත් කෙරේ.
- පොලිය දිනපතා එකතු වන අතර මාසිකව ගිණුමට බැර කෙරේ.
- ගිණුම විවෘත කරන දින සිට මාස හැටක් (වසර 5ක්) සම්පූර්ණ වූ පසු, ශේෂය බාල වයස්කාරයා විසින් පවත්වාගෙන යනු ලබන වෙනත් ගිණුමකට, දෙමාපියන්ගේ/භාරකරුගේ අභිමතය පරිදි මාරු කළ හැකිය.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් එක් තැන්පත්කරුවෙකු සඳහා උපරිම වශයෙන් රුපියල් 1,100,000ක් දක්වා වන්දි ගෙවීම සඳහා, ඉතුරුම් ගිණුම් රක්ෂණය කර ඇත.
- වයස අවුරුදු 18 දී ගිණුම වසා දැමීමකදී හෝ වෙනත් බැංකුවක/මූල්‍ය සමාගමක පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීමකදී, සමාගම විසින් රුපියල් 300ක සේවා ගාස්තුවක් අඩු කරනු ලැබේ.
- ගිණුම අප සමඟ සාමාන්‍ය ගිණුමකට මාරු කරන්නේ නම්, කිසිදු සේවා ගාස්තුවක් අය නොකෙරේ.

ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීම සඳහා පහත ලිපි ලේඛන නිසි පරිදි පුරවා ළඟම ඇති ශාඛාවට ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය නම් ඔබට මෙහි ලේඛන පහත සබැඳියෙන් බාගත කළ හැක.

https://www.singerfinance.com/downloads/

- ඉතුරුම් අයදුම් පත්‍රය
- උප්පැන්න සහතිකයේ පිටපතක් - බාල වයස්කරුගේ
- ගනුදෙනුකරු පිලිබඳ දැන ගැනීමේ පෝරමය (KYC) - දෙමාපියන්ගේ/භාරකරුගේ
- FATCA පෝරමය - දෙමාපියන්ගේ/භාරකරුගේ
- ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක් - දෙමාපියන්ගේ/භාරකරුගේ
- ලිපිනය තහවුරු කිරීම සඳහා ලේඛන (අවශ්‍ය නම්)

අප සමාගම ආකර්ශනීය පොලී අනුපාත ළමා ඉතුරුම් ගිණුම් සඳහා පිරිනමනු ලැබේ. පාරිභෝගිකයාට දැනුම් දීමකින් තොරව ගාස්තු සංශෝධනය කිරීමට සමාගමට අයිතිය ඇත.

පොලී අනුපාත පත්‍රය පහත සබැඳියෙන් බාගත කළ හැක.
https://www.singerfinance.com/savings-accounts/

මෙහි පැමිණිලි හෝ යෝජනා ඉදිරිපත් කළ හැක.

අවශ්‍ය නම් පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය පහත සබැඳියෙන් බාගත කළ හැක.
https://www.singerfinance.com/wp-content/uploads/2024/08/Complaint-Handling-Policy-Sinhala-Version.pdf